# ජනතාව අධිකරණය ප්‍රශ්න කිරීම

## කපිල එම් ගමගේ

විත්‍යාගේ ඝාතනයේ දී නීතියේ සාධාරණ භාවය හා ආධිපත්‍ය පිළිබඳව මිනිසුන් වීදී බැස ප්‍රශ්ණ කලා. එය නිමාවී සති දෙකක් ගෙවෙන විට කොටකෙතන ඝාතන නඩු තීන්දුව යළි ප්‍රශ්ණ කරමින් මිනිසුන් වීදි බැස්සා. මේ සිදුවීම් දෙක පෙරළා සමාජයට දබරැල්ල දිගුකරමින් ප්‍රශ්ණ කරන්නේ මොකද්ද? ශ්‍රී ලංකාවේ නීතියේ ආධිපත්‍ය පිළිබඳව ජනතා විශ්වාසය බිඳ වැටී ඇති බව නොවේද?

ප්‍රජාතන්ත්‍රවාදී රටක සමාජ ජීවිතය වඩාත් ශක්තිමත් කරන ප්‍රධාන ආයතන කිහිපය වන්නේ විධායකය, ව්‍යවස්ථාදායකය, අධිකරණය හා ජනමා ධ්‍ය ය. ප්‍රජාතන්ත්‍රවාදි පාලන ව්‍යුහයක් ශක්තිමත්ව ඔසවා සිටින මේ කුළුණු 4 පිළිබඳ



පුරවැසියන්ගේ විශ්වාසය බිඳවැටෙන්නේ නම් එම සමාජය අයාලේ යන ගෝත්‍රික සමාජයක අංග ලක්ෂණ පෙන්නුම් කිරීම අනිවාර්ය වේ. අප තවදුරටත් ඇදී යමින් සිටින්නේ ඒ නොදියුණු අතීතය වෙතය. එය ඇදී යාමකට වඩා ඇදගෙන යාමකි.

මේ තත්ත්වයට ජන මනස පත් කරමින් තමන්ට යහපත් සමාජ ආර්ථික දේශපාලන ජීවිතයක් උරුම කර දෙතැයි ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියන් විශ්වාස කරන ආයතන කුණු බක්කියට ඇද දැමූ කුණු දේශපාලන ශරීරය ඉවත දමා වඩාත් නිරෝගී දේශපාලන භාවිතාවකට අවශ්‍ය සමාජ තෙරපුම ලබා දිය යුත්තේ සමාජය විසින්මය. එසේ නැතිව මෙහිදී පාරට බසින ජනතාව හිරේ විලංගුවේ දැමීම හෝ කඳුළු ගෑස්, ජල ප්‍රහාර එල්ල කරණවාට වඩා එවැනි ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියක් ශක්තිමත් කරන පහත සඳහන් ප්‍රශ්ණ කිහිපයට අපි පිළිතුරු සොයාගත යුතුය.

1. අපේ විධායකය පිළිබඳව ඇති ජනතා විශ්වාසය කෙබඳුද?

2. අපේ ව්‍යවස්ථාදායකයේ සංයුතිය හා ගුණාත්මකභාවය ඉහළ දමන්නේ කෙලෙසද?

3. අධිකරණය දේශපාලනයෙන් ස්වාධීන ආයතනයක් කර නීතියේ ආධිපත්‍ය පිළිබඳ ධනාත්මක හැඟීමක් පුරවැසි මනස තුල ගොඩනගන්නේ කෙලෙසද?

4. ජනමාධ්‍ය තමන්ගේ ප්‍රධානම සමාජ කාර්යය වන ලමුරපල්ලාල කාර්යය වෙත සීරුමාරු වන ව්‍යුහාත්මක වෙනස්කම් ඇති කරන්නේ කෙලෙසද?

මේ ගැටලු වලට සාරවත් දේශපාලන, සමාජ විසඳුම් නොසොයා ජනතාව නීතියට ගරු කළයුතුය. ජනතාව නීතිය අතට නොගත යුතුය යැයි හඬ නැගීම ලපය බරවායට පිටිකර බෙහෙත් බැඳීමක් වන බව තේරුම් ගැනීමට තරම් අපේ සමාජය ප්‍රඥාවන්ත විය යුතුය.












මෘදුතම ආලයකි
වරක් පමණක් හමුවුණ
ගමන් සගයෙක්ය ඔබ.

සසර කෙතරම් දිගද
අනන්තය පවා කෙටිය
අහඹු හමුවීම් අසළ .

නැවත හමුවෙමුයි නොකියමු
ශෝක රසයක් සහිතය
මේ සෙනෙහස.

වසත් කල
මල් දරනු ඇත නැවත
මේ උයන.

තොල් සිඹිනු නොහොබී
කඳුළකින් ලියවෙන
ප්‍රේමයක.

**රසිකා ගුණවර්ධන**